ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල / மாகாண சபை அலுவலகத் தொகுதி, குருணாகல் / Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය / தாபனமும் நிருவாக பிரிவு / Establishment and Administration Division

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எமது இலக்கம் / My No | NWP/CS/AD/8/7/10-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | | දිනය / திகதி / Date | 2022.06. 17 |

වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්,
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>වයඹ පළාත් සභා සංවර්ධන නිලධාරි සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2022</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2022.03.22 දිනැති ලිපිය මගින් දැනුම් දෙන ලද ස්ථාන මාරු නියෝගය සම්බන්ධයෙන් අදාල නිලධාරින් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව, වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් ගන්නා ලද තීරණය අනුව සකස් කරන ලද සමස්ථ ස්ථාන මාරුවීම් ලැයිස්තුව මෙහි ඇමුණුම් 01 හි දැක්වෙන අතර, ඔබ ආයතනයේ සේවය කරන සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින්ට එම ස්ථාන මාරුවීම් නියෝගය දැන ගැනීමට සලස්වා 2022.07.01 දින නව සේවා ස්ථානයේ වැඩ භාරගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වමි.

02. එසේම මගේ සමාංක හා 2021.08.16 දිනැති වාර්ෂික ස්ථාන මාරු දැනුම් දීමේ ලිපියේ 5.3 ඡේදයෙන් දැනුම් දුන් පරිදි 2021 වාර්ෂික ස්ථානමාරු නියෝග අනුව වසරක් සඳහා ස්ථාන මාරු දීර්ඝ කරන ලද සංවර්ධන නිලධාරින්ගේ ස්ථාන මාරුද මෙම දිනට ක්‍රියාත්මක කල යුතුය.

03. තවද වයඹ පළාත් සභා සංවර්ධන නිලධාරින් විසින් මා වෙත යොමු කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසුව මෙම ස්ථාන මාරුවීම් නියෝග ලබා දී ඇති බැවින් නැවත අභියාචනා භාර නොගන්නා බවද අදාල නිලධාරින්ට දැන්විය යුතුය.

04. එමෙන්ම, සියළුම ස්ථාන මාරුවීම් නියෝග ලබා ඇති සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින්ගේ අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වනසේ මුදා හැරීමට කටයුතු කල ද යුතු බවද වැඩිදුරටත් දන්වමි.

පී.බී.එම්.සිරිසේන ,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

C:\Users\User\Desktop\desktop\වාර්ෂික ස්ථාන මාරු 2022\2022 ස්ථාන මාරු ලිපිය.docx

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mail : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk
ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — Tel : 037-2223777, Fax : 037-2228019, e-mail : csnwp@sltnet.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) — Tel : 037-2223195, e-mail : depcsnwp@sltnet.lk